දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 2784807 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்லை.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ....

මගේ අංකය / எனது இல. / My No. } ED/01/05/01 /01/43

දිනය / திகதி / Date } 2015.08. 14

චක්‍රලේඛ අංකය:01/2015

දිනය : 2015/01/06

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පාසල්වල විදුහල්පතිවරුන්,

භාෂා ප්‍රවර්ධන කව පිහිටුවීම

ශ්‍රී ලංකාව වූ කලී බහු සංස්කෘතික, බහු ආගමික සමාජයක් පවතින රටකි. එම සමාජයේ විවිධ භාෂා කථා කරන පුද්ගලයෝ ජීවත් වෙති. ජාතීන් අතර සමගිය, සහජීවනය, එකමුතුකම ඇති කිරීම සඳහා අන්‍ය භාෂාවන් දැනගැනීම අත්‍යාවශ්‍ය සාධකයකි. අන්‍ය භාෂා දැනගැනීමෙන් අනවබෝධය තුරන් වී ජාතීන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ගොඩනැගේ. එය රටක සංවර්ධනයේ පෙරදැක්මකි. එම භාෂා දැනුම ලබා ගැනීමට අත්තිවාරම දැමිය හැක්කේ පාසලටය. එබැවින් දෙවන ජාතික භාෂාවක් හැදෑරීමට මෙන් ම ඒ තුළින් කටයුතු කිරීමේ හැකියාවක් ද සිසුන් විසින් ලබාගත යුතු වේ. එය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කිරීමට භාෂා ප්‍රවර්ධන කව පාසල් තුළ පිහිටුවීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. එබැවින් පහත සඳහන් උපදෙස් අනුව ඔබ පළාතට අයත් සියලුම පාසල්වල භාෂා ප්‍රවර්ධන කව පිහිටුවීමට විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

භාෂා ප්‍රවර්ධන කව පිහිටුවීමේ අරමුණු

1. ද්විභාෂාවෙන් හෘදයංගමව බැඳුණු එකම ලාංකේය ජාතියක් බිහිකිරීමේ අරමුණට සිසු පරපුර ළඟා කිරීම.
2. පාසල් ළමුන් තුළ ත්‍රිභාෂා භාවිත කිරීම සම්බන්ධයෙන් ආකල්ප හා උනන්දුව ඇති කිරීම.
3. පාසල් තුළදී ඇසෙන, දකින, කියවන සෑම දෙයක්ම ත්‍රිභාෂාවෙන්ම සිදු කිරීම.
4. මව් භාෂාව, දෙවන ජාතික භාෂාවක් වශයෙන් සිංහල හෝ දෙමළ භාෂාවත්, සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාවත් යන භාෂා තුනම ප්‍රායෝගික ලෙස භාවිතයට ගැනීම උනන්දු කරවීම.
5. පන්ති කාමරයේ න්‍යායිකව ඉගෙනුම ලබන භාෂා, ප්‍රායෝගික ලෙස භාවිත කිරීමේ කුසලතාව ලබා ගැනීම.
6. සියලුම බාහිර කටයුතුවලදී ප්‍රායෝගික වශයෙන් ත්‍රිභාෂාව භාවිත කරමින් වැඩසටහන් මෙහෙයවීම.

   උදා - ක්‍රීඩා කටයුතු, රැස්වීම්වලදී

7. භාෂා කව මගින් බහු සංස්කෘතික උරුමයන් හඳුනා ගැනීම.
8. අදාළ ආයතන සමග සම්බන්ධ වෙමින් භාෂා කුසලතා සංවර්ධනය කර ගැනීම.
9. සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා යොදා ගන්නා පරිසරයක් පාසලේ නිර්මාණය කිරීම.
10. අනාගත සමාජය ත්‍රිභාෂා සමාජයක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීම.
11. භාෂා අයිතීන් තහවුරුකිරීමේ අවශ්‍යතාව තේරුම් ගැනීම.
12. රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව නිරීක්ෂකයන් සහ ක්‍රියාකාරීන් ලෙස දායකත්වය ලබාදීම.

සංයුතිය/ සාමාජිකත්වය

අනුශාසක :- නිලබලයෙන් විදුහල්පති

උපදේශක මණ්ඩලය :- මව්භාෂාව, දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ) හා ඉංග්‍රීසි ඉගැන්වීම් කරන සියලු ගුරුභවතුන් උපදේශක මණ්ඩලය ලෙස ක්‍රියාකළ යුතු අතර එක් ගුරුභවතෙකු ප්‍රධාන භාණ්ඩාගාරික වශයෙන් පත්කර ගත හැක.

සාමාජිකත්වය

1. ශිෂ්‍ය නියෝජිතයන් - සෑම සමාන්තර පන්තියකින්ම එක් නියෝජිතයෙකු බැගින්
2. සෑම බාහිර ක්‍රියාකාරකම් කණ්ඩායමකින් එක් සාමාජිකයකු බැගින්
(උදා: බාලදක්ෂ ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩායම්, ක්‍රීඩා කණ්ඩායම් ආදී වශයෙන්) සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති පාසල්වල සියලුම සිසුන් රැස්වී එක් කවයක් පිහිටුවීම.

නිලධාරි මණ්ඩලය :- ඉහත සාමාජිකයන් එක් රැස්වූ මහා සභාවකදී පහත සඳහන් නිලධාරී මණ්ඩලය පත්කර ගත යුතුය.

1. කැඳවුම්කරු - පාසල් කවය තුළ එක් කැඳවුම්කරුවකු පත් කර ගැනීම.
2. ලේකම් - වාර්තා තබා ගැනීමට ලේකම්වරයකු පත් කර ගැනීම.
3. ප්‍රධාන භාණ්ඩාගාරික - මූල්‍යමය කටයුතු සඳහා ගුරුවරයෙකු
4. ශිෂ්‍ය භාණ්ඩාගාරික - ප්‍රධාන භාණ්ඩාගාරිකගේ කටයුතුවලට සහාය සඳහා තෝරාගැනීම

ක්‍රියාකාරකම්

පාසැල් සිසුන් විසින්ම තෝරාගන්නා ලද වැඩසටහන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මත රාජ්‍ය භාෂා කොමිෂන් සභාව යෝජනා කරනු ලබන ක්‍රියාකාරකම් ද පහත විශේෂයෙන් සඳහන් ක්‍රියාකාරකම් ද මෙයට ඇතුළත්ය. ඒ අනුව,

1. පාසලේ ප්‍රධාන නාමපුවරුවේ සිට අනිකුත් සියලුම පුවරු ත්‍රිභාෂාවෙන් ම ප්‍රදර්ශනය කිරීම.
2. පාසල තුළ සිදුවන සියලුම ක්‍රියාකාරකම්වල දී සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනම භාවිත කිරීම.
3. ත්‍රිභාෂා තරග පවත්වා ජයග්‍රාහකයින්ට ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කිරීම.
4. ත්‍රිභාෂා භෝඩිය පාසල් බිත්තියක ප්‍රදර්ශනය කිරීම හා දිනපතා, සතිපතා, මාසපතා, වචන හා වාක්‍ය නිර්මාණය කිරීම සහ ඒ සඳහා ලකුණු ලබා දී ජයග්‍රාහකයින් උනන්දු කිරීමේ වැඩසටහන්
5. අනෙක් භාෂාවලින් අධ්‍යාපන කටයුතු කරන මිත්‍රත්ව පාසල් කර ගෙන සංස්කෘතිය සහ සුහදත්වය හුවමාරු කරගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

6. ජාතික උත්සවවලදී ත්‍රිභාෂාවම යොදා ගනිමින් කටයුතු කිරීම.
   උදා - නිවේදන කටයුතු, ආරාධනා පත්‍ර, සැරසිලි සහ ප්‍රකාශන
7. අවට ජනතාවගේ භාෂා අවශ්‍යතාවලදී ඒවාට සහය ලබාදීම.
8. අදාළ ක්‍රියාකාරකම් සඳහා දෙමව්පියන්ගේ උදවු ලබාගැනීම තුළින් ඔවුන් ද සමාජ කණ්ඩායමක් ලෙස භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
9. භාෂාව, ආර්ථික හෝ අනෙකුත් හේතූන් මත මුලුගැන්වෙන සිසුන්ට සම අවස්ථා ලැබෙන පරිසරයක් පාසල තුළ නිර්මාණය කිරීමට කටයුතු කිරීම.
10. ත්‍රිභාෂා මානසිකත්වයක් මත වැඩකටයුතු කරමින්, තම අවට පරිසරයේ ඇති ත්‍රිභාෂා භාවිතය පිළිබඳ ගැටලු, ප්‍රශ්න සහ යෝජනා නිරීක්ෂණයකොට රාජ්‍ය භාෂා කොමිසමට දැනුම් දීම.

සහයෝගය ලබාගත හැකි ආයතන

1. අධ්‍යාපන අමාත්‍යාංශයේ දෙවන ජාතික භාෂා අංශය
2. රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශය
3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
4. සියලුආගමික ආයතන
5. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
7. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
8. ජාතික අධ්‍යාපන ආයතනය
9. ප්‍රාදේශීය මට්ටමින් පිහිටුවා ඇති ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අංශය යටතේ පිහිටුවා ඇති භාෂා සංගම්

නියාමන කටයුතු

අධ්‍යාපන අමාත්‍යාංශයසහරාජ්‍ය භාෂා කොමිෂන් සභාව සමග සම්බන්ධ වී මෙම ක්‍රියාකාරකම් නියාමනය කරනු ලැබේ.

ඉහත සඳහන් උපදෙස් පරිදි ඔබ පාසල් භාෂා ප්‍රවර්ධන කව පිහිටුවා සෑම වර්ෂයකම මාර්තු 31ට පෙර මේ සමග ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර අදාළ නිලධාරීන්ගේ නාම ලේඛන අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය, ඉසුරුපාය, බත්තරමුල්ල වෙත ද පිටපතක් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත ද යොමු කරන මෙන් ඉල්ලමි.

උපාලි මාරසිංහ
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :

1. ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
2. පළාත් ප්‍රධාන ලේකම් - .... පළාත
3. විගණකාධිපති
4. සභාපති - රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

භාෂා කව සම්බන්ධ තොරතුරු හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

மொழிவட்டம் தொடர்பான தகவல்கள் மற்றும் செயற்பாட்டுத்திட்டம்

Information on Language Circles and the Action Plan

1. පළාත / மாகாணம் /Province -

2. කලාපය /வலயம்/ Zone -

3. පාසලේ නම/பாடசாலை பெயர்/Name of School -

4. ලිපිනය / முகவரி/Address -

5. දුරකථන අංකය /தொலைபேசி இல/Telephone No -

6. විද්‍යුත් ලිපිනය / மின்னஞ்சல் முகவரி/Email Address -

7. විදුහල්පතිගේ නම/ அதிபர் பெயர்/Name of Principal -

8. පාසල් වර්ගය - (1AB/1C/2/3, ගැහැණු/පිරිමි/මිශ්‍ර)
   பாடசாலை வகை- (1AB/1C/2/3, பெண் / ஆண் / கலவன்)
   School Type - (1AB/1C/2/3, Girls/Boys/Mixed)

9. පාසල් සංගණන අංකය / பாடசாலை தொகை மதிப்பு இலக்கம்/Census No -

10. පාසැලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව /பாடசாலையிலுள்ள மொத்த மாணவர் தொகை/
    No of Students on Roll –

11. ගුරුවරු මුළු සංඛ්‍යාව /ஆசிரியர் முழுத்தொகை/No of Teachers on Roll -

12. සිංහල ගුරුවරු සංඛ්‍යාව /சிங்கள ஆசிரியர் தொகை/No of Sinhala Teachers on Roll ☐

    ඉංග්‍රීසි ගුරුවරු සංඛ්‍යාව/ஆங்கில ஆசிரியர் தொகை/ No of English Teachers on Roll ☐

    දෙවන ජාතික භාෂාව සිංහල/දෙමළ ගුරුවරු සංඛ්‍යාව/
    இரண்டாம் தேசிய மொழி சிங்களம் /தமிழ் ஆசிரியர் தொகை
    No of Second Language Teachers on Roll ☐

    අනෙකුත් භාෂා ගුරුවරු සංඛ්‍යාව/பிற மொழி ஆசிரியர் தொகை/No of Teachers of other Languages ☐

☐

13. ඔබ පාසලේ පන්ති පවත්වනු ලබන මාධ්‍ය - සිංහල / சிங்களம் /Sinhala
දෙමළ/ தமிழ்/ Tamil
Media in which classes are conducted in your school - ඉංග්‍රීසි/ஆங்கிலம்/English

14. ඉහත භාෂාවන් හැර වෙනත් භාෂාවන් ඔබ පාසලේ උගන්වනු ලබයිද ?
மேற்படி மொழிகள் தவிர்ந்த ஏனைய மொழிகளில் கற்பித்தல் நடைபெறுகின்றதா?
Are any languages other than those mentioned above taught in your school?

15. එසේ නම් එම භාෂාවන් මොනවාද ?
அப்படியாயின் அவ்விதமான மொழிகள் எவை?
If "yes" name such languages

16. පාසැලේ ඇති පන්ති සංඛ්‍යාව / பாடசாலையிலுள்ள வகுப்புக்களின் எண்ணிக்கை
Number of classes in the school

17. ඔබගේ කවය පිහිට වූ දිනය / உங்கள் வட்டம் ஸ்தாபிக்கப்பட்ட திகதி?
Date on which the Circle was formed

18. කවයේ සිටින මුළු සාමාජික සංඛ්‍යාව /கல்வி வட்டத்திலுள்ள உறுப்பினர் தொகை?
Total number of members in the Circle

	නම/பெயர்/Name	දු.ක. අංකය/ தொ.பே.இல Telephone No	විද්‍යුත් ලිපිනය/ ஈ-மெயில் Email Address
කවය භාර ගුරුවරයා வட்டத்திற்கு பொறுப்பான ஆசிரியர் Teacher in charge of the Circle			
කැඳවුම්කරු/அழைக்கப்பட்டோர் Convenor			
අනුශාසක මණ්ඩලය காப்பாளர் சபை Board of Patrons			
1.			
2.			
3.			
ලේකම්/செயலாளர்/Secretary			
භාණ්ඩාගාරික - ගුරුවරයා பொருளாளர்-ஆசிரியர்			

Treasurer - Teacher			
භාණ්ඩාගාරික - ශිෂ්‍ය பொருளாளர்- மாணவர் Treasurer - Student			
පන්ති නියෝජිතයෝ:- பொறுப்பாளர் வகுப்பு Class representatives			
පංතිය/ வகுப்பு/Class			

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
Annual Action Plan
வருடாந்த செயற்பாட்டுத் திட்டம்

ක්‍රියාකාරකම් செயற்பாடு **Activities**	වැඩසටහන நிகழ்ச்சித்திட்டம் Programme	කාලරාමුව நேரம் **Time Frame**	ප්‍රගතිය பெறுபேறுகள் **Progress**	වගකීම பொறுப்பு Responsibility
1. පාසලේ ප්‍රධාන නාමපුවරුවේ සිට අනිකුත් සියලුම පුවරු ත්‍රිභාෂාවෙන් ම ප්‍රදර්ශනය කිරීම. பாடசாலையில் பிரதான பெயர்ப்பட்டியல் உள்ளடலங்கலான அனைத்துப் பெயர்ப்பட்டியலும் மும்மொழிகளில் காட்சிப்படுத்தல் Preparing the name boards including the school name board in all three languages				
2. පාසල තුළ සිදුවන සියලුම ක්‍රියාකාරකම් වලදී සන්නිවේදන කටයුතු සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනම භාවිත කිරීම. பாடசாலையினுள்ளே நடைபெறும் சகல செயற்பாடுகளின் போதும் தொடர்பாடல் செயற்பாட்டிற்காக சிங்களம் தமிழ் ஆங்கிலம்ஆகிய மும்மொழிகளையும் பயன்படுத்தல் Using Sinhala, Tamil and English languages for communication in all activities happening in the school				
3. ත්‍රිභාෂා තරඟ පවත්වා ජයග්‍රාහකයින්ට ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කිරීම. மும்மொழிப் போட்டிகளை நடாத்தி வெற்றி பெற்றவர்களுக்கு சான்றிதழ் மற்றும் பரிசில்களை வழங்கல் Conducting trilingual competitions and awarding certificates and prizes to winners				

4. ත්‍රිභාෂා හෝඩිය පාසල් බිත්තියක ප්‍රදර්ශනය කිරීම හා දිනපතා, සතිපතා, මාස්පතා, වචන හා වාක්‍ය නිර්මාණය කිරීම සහ ඒ සඳහා ලකුණු ලබා දී ජයග්‍රාහකයින් උනන්දු කිරීමේ වැඩසටහන් மும்மொழி கொடியை பாடசாலை சுவர்களில் காட்சிப்படுத்தி மற்றும் ஒவ்வொரு நாளும் ஒவ்வொரு மாதமும் சொற்கள் மற்றும் வாக்கியங்களை உருவாக்குதல் மற்றும் புள்ளிகளை வழங்கி வெற்றி பெறும் மாணவர்களை ஊக்கப்படுத்தல் Displaying the trilingual alphabet on a school wall, creation of words and sentences daily, weekly and monthly and motivating students by awarding marks.															
5. අනෙක් භාෂාවලින් අධ්‍යාපන කටයුතු කරන මිත්‍රත්ව පාසල් කරාගොස් සංස්කෘතිය සහ සුහදත්වය හුවමාරු කරගැනීමේ වැඩසටහන් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම. பிற மொழிகளில் கல்வி நடவடிக்கைகளில் ஈடுபடும் நேயப் பாடசாலைகளுக்கு சென்று கலாசார மற்றும் நட்புறவினை பரிமாற்றும் செய்யும் வேலைத்திட்டமொன்றை நடைமுறைப்படுத்தல் Organizing exchange programs with friendly schools where classes are conducted in other media, with a view to share culture and friendship															
6. ජාතික උත්සව වලදී ත්‍රිභාෂාවම යොදා ගනිමින් කටයුතු කිරීම. උදා - නිවේදන කටයුතු, ආරාධනා පත්‍ර, සැරසිලි සහ ප්‍රකාශන தேசிய விழாக்களின் போது மும்மொழியைப் பயன்படுத்த நடவடிக்கை எடுத்தல் உதா. அறிவித்தல் அழைப்பிதழ் பதாதைகள் மற்றும் காட்சிப்படுத்தலின் போது Using all three languages in conducting national festivals															

E.g. announcing, invitation, decorating and publication															
7. අවට ජනතාවගේ භාෂා අවශ්‍යතා වලදී ඒවාට සහය ලබාදීම சுற்றிவர உள்ள மக்களின் மொழித் தேவைகளின் போது அவர்களுக்கு உதவிகளை பெற்றுக் கொடுத்தல் Assisting the community in language related matters															
8. අදාළ ක්‍රියාකාරකම් සඳහා දෙමව්පියන්ගේ උදව් ලබාගැනීම තුළින් ඔවුන් ද සමාජ කණ්ඩායමක් ලෙස භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම. மேற்படி செயற்பாடு தொடர்பாக பெற்றோரின் உதவியைப் பெற்றுக் கொடுத்தல் அதனூடாக இணைந்து மொழிக்கொள்கையை அறிவூட்டல் Making the parents, as a social group, aware of the language policy through obtaining their contributions to the relevant activities.															
9. භාෂාව, ආර්ථික හෝ අනෙකුත් හේතූන් මත මුළුගැන්වෙන සිසුන්ට සම අවස්ථා ලැබෙන ලෙස පාසල තුළ පරිසරයක් නිර්මාණය කිරීමට කටයුතු කිරීම. மொழி, பொருளாதாரம், அல்லது வேறு காரணங்களாக அவர்களுக்குச் சம சந்தர்ப்பத்தைப் பெற்றுக் கொடுக்க பாடசாலையினுள்ளே ஒரு சூழலை உருவாக்க நடவடிக்கை எடுத்தல் Creating a positive environment in the classroom by ensuring opportunities for students who are backward due to language barriers economic or other reasons.															
10. ත්‍රිභාෂා මානසිකත්වයක් මත වැඩකටයුතු කරමින්,															

තම අවට පරිසරයේ ඇති ත්‍රිභාෂා භාවිතය පිළිබඳ ගැටලු, ප්‍රශ්න සහ යෝජනා නිරීක්ෂණයකොට රාජ්‍ය භාෂා කොමිසමට දැනුම් දීම. மும்மொழி மனநிலைகளின் போது தமது அயற் சமுதாயங்களின் மும்மொழிப் பயன்பாடு தொடர்பாக பிரச்சனைகளுக்கான தீர்வுகளை பரிசீலனை செய்து அரச மொழிகள் ஆணைக்குழுவிற்கு தெரியப்படுத்தல் Observing problems issues and suggestions related to the use of three languages in the immediate environment, working in a trilingual mentality, and informing the findings to the State Language Commission															

ඉහත විස්තර නිවැරදි බවට සහතික කරමි

மேற்படி தகவல்கள் யாவும் உண்மையென உறுதிப்படுத்துகின்றேன்.

I certify that the information furnished above is correct.

කැඳවුම්කරු/அழைக்கப்படுபவர்/convenor

ලේකම්/செயலாளர்/Secretary

විදුහල්පති/அதிபர்/Principal

දිනය /தினம்:/Date